# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත

---

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු මස 26 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත

[සහතිකය සටහන් කළේ 2002 මාර්තු 26 වන දින]

එල්.ඩී.—ඕ. 6/2002.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ ව්‍යවස්ථාවේ උපලේඛනයේ II වන කොටසේ නියමය කොට දැක්වෙන ඇතැම් ධුරවලට පත් කරන ලද තැනැත්තන් ඉවත් කිරීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනතේ මින් ඉදිරියට ගෙනහැර දැක්වෙන කාර්ය පටිපාටිය අනුව හැර – ඇතැම් ධුර දරන්නන් මේ පනතේ දැක්වෙන කාර්ය පටිපාටිය අනුව හැර ඉවත් නොකළ යුතු බව.

(අ) නීතිපති ;

(ආ) පොලිස්පති,

යන ධුර දරන්නන්, එකී ධුරවලින් ඉවත් නොකළ යුත්තේ ය.

**3.** මේ පනතේ 2 වන වගන්තියේ සඳහන් ධුරවලට පත් කරනු ලැබූ තැනැත්තන් පහත දැක්වෙන යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය :– 2 වන වගන්තියේ සඳහන් ධුර දරන තැනැත්තන් ඉවත් කරනු ලැබිය හැකි හේතු.

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත්වූවකු බවට තීන්දු කරනු ලැබීම ;

(ආ) රෝගාතුර වීම නිසා හෝ ශාරීරික හෝ මානසික අබලතාව නිසා ධුරයේ කටයුතු කරගෙන යාමට නුසුදුසු වීම ;

(ඇ) චරිත දූෂණය, රාජද්‍රෝහය හෝ අල්ලස ඇතුළත් වරදකට වරදකරු කරනු ලැබීම ;

(ඈ) විෂමාචාරය හෝ දූෂණය සම්බන්ධයෙන් වරදකරු වීම ;

(ඉ) ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදාගැනීම සම්බන්ධයෙන් වරදකරු වීම ;

(ඊ) බරපතල ලෙස රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරු වීම ;

(උ) ධුරයේ කටයුතුවල දී දැඩි පක්ෂග්‍රාහිත්වය සම්බන්ධයෙන් වරදකරු වීම ; හෝ

(ඌ) ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වීම.

3 වන වගන්තියේ (අ), (ආ), (ඇ) හා (ඌ) වන ඡේදවල සඳහන් හේතු මත ඉවත් කිරීම.

4. (1) 3 වන වගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඌ) වන ඡේදවල සඳහන් හේතු එකක් හෝ වැඩි ගණනක් මත 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ධුර දෙකින් කවර හෝ ධුරයක් දරන්නකු ඉවත් කිරීම ජනාධිපතිවරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමේ දී ජනාධිපතිවරයා විසින්, ඒ උපවගන්තියේ සඳහන් කර ඇති හේතු පවත්නා බව තහවුරු කිරීම පිණිස ස්වකීය මතය අනුව ප්‍රමාණවත් වාචික හෝ ලිඛිත සාක්ෂි සැලකිල්ලට ගත යුත්තේ ය.

ඇතැම් අවස්ථාවල දී ඉවත් කිරීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය.

5. (1) 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කවර හෝ ධුරයක් දරන තැනැත්තකු 3 වන වගන්තියේ (ඈ), (ඉ), (ඊ) හෝ (උ) වන ඡේදවල සඳහන් හේතු මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කිරීම, පරීක්ෂණ කමිටුවක් පත් කිරීම සඳහා (පැමිණ නොසිටි මන්ත්‍රීවරුන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයක් විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් පසු විය යුත්තේ ය :

එසේ වුවද යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීම පැමිණ නොසිටි මන්ත්‍රීවරුන් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වැඩි ගණනක් විසින් අත්සන් කර ඇත්තේ නම් මිස, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් කථානායකවරයා විසින් භාරගනු නොලැබිය යුත්තේ ය.

(2) (1) වන උපවගන්තිය අනුව වූ යෝජනා සම්මතයක් ලැබුණු විට, ඉවත් කිරීම අපේක්ෂා කරන චෝදිත හේතු සම්බන්ධයෙන් විභාග කර බලා තම තීරණ වාර්තා කිරීම

පිණිස (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පරීක්ෂණ කමිටුවක් පත් කරනු ලැබිය යුත්තේ ය.

පරීක්ෂණ කමිටුවේ සංයුතිය.

6. 5 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුව පිහිටුවන ලද කමිටුවක්, පහත සඳහන් තැනැත්තන්ගෙන් සංයුක්ත විය යුත්තේ ය :–

(අ) පරීක්ෂණය, නීතිපතිවරයා සම්බන්ධයෙන් වන විට දී, කමිටුව, සමාජිකයන් තුන් දෙනකුගෙන් එනම්, එහි සභාපතිවරයා විය යුතු අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් ද, නීතිපති ධුරය කලින් දරා ඇති තැනැත්තන් හෝ නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨ තත්ත්වයක් ලබා සිටින තැනැත්තන් අතුරෙන්, අග්‍රාමාත්‍යවරයාගේ සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ එකඟත්වය ඇතිව කථානායකවරයා විසින් පත් කරනු ලබන තවත් තැනැත්තන් දෙදෙනකුගෙන් ද සමන්විත විය යුත්තේ ය ; තව ද

(ආ) පරීක්ෂණය, පොලිස්පතිවරයා සම්බන්ධයෙන් වන විට දී, කමිටුව, සාමාජිකයන් තුන්දෙනකුගෙන් එනම්, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන, එහි සභාපතිවරයා විය යුතු, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුගෙන් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පොලිස් කොමිෂන් සභාවේ සභාපති ධුරය දරන තැනැත්තාගෙන් ද සහ නීතිය හෝ රාජ්‍ය පරිපාලන කළමනාකරණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨ තත්ත්වයක් ලබා සිටින තැනැත්තන් අතුරෙන්, අග්‍රාමාත්‍යවරයාගේ සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ එකඟත්වය ඇතිව, කථානායකවරයා විසින් පත් කරනු ලබන තැනැත්තකුගෙන් ද සමන්විත විය යුත්තේ ය.

සභාපතිවරයා රැස්වීම්වල මූලාසනය දැරිය යුතු බව.

7. (1) කමිටුවේ සභාපතිවරයා, කමිටුවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුත්තේ ය.

(2) පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුව විසින් එහි කාර්ය පරිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

කමිටුවේ කර්තව්‍ය.

8. (1) කමිටුවේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි වන්නේ ය:—

(අ) 2 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ධුර දෙකින් කවර ධුරයක් හෝ දරන්නකු ඉවත්කිරීමට අපේක්ෂා කරන්නේ කවර චෝදිත හේතු මත ද ඒ චෝදිත හේතු පරීක්ෂාකර විමර්ශනය කිරීම ; සහ

(ආ) ඒ ධුර දරන්නන් ඉවත් කිරීම සම්බන්ධයෙන් කියාපාන හේතු පිළිබඳ තීරණ ගැනීම සහ ඒ තීරණ කථානායකවරයා වෙත දැනුම්දීම.

(2) කමිටුවේ තීරණය කමිටුවේ සාමාජිකයන්ගේ බහුතරයේ තීරණය විය යුත්තේ ය.

කමිටුවේ බලතල.

9. ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා කමිටුවට පහත සඳහන් බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ තිබිය යුත්තේ ය :—

(අ) ලබා ගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීම හා භාර ගැනීම සහ ප්‍රශ්න කරනු ලැබීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කමිටුව කල්පනා කරන සියලු තැනැත්තන්ගෙන් සාක්ෂිකරුවන් ලෙස කැඳවා ප්‍රශ්න කිරීම ;

(ආ) දිවුරුම පිට හෝ ප්‍රතිඥාව පිට යම් සාක්ෂිකරුවකුට ලිඛිත හෝ වාචික සාක්ෂි දෙන ලෙස නියම කිරීම, ඒ දිවුරුම හෝ ප්‍රතිඥාව ඒ සාක්ෂිකරු අධිකරණයක සාක්ෂි දෙන්නේ නම් ඔහු විසින් දිය යුතු බවට නියම කරනු ලැබිය හැකි දිවුරුම හෝ ප්‍රතිඥා දීම විය යුතු ය. තව ද, තත් කාර්යය සඳහා කමිටුව විසින් බලය දී ඇති නිලධරයකු මගින් ඒ සෑම සාක්ෂිකරුවකුම ලවා දිවුරුමක් හෝ ප්‍රතිඥාදීමක් හෝ කරවිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින යම් තැනැත්තකු සාක්ෂි දීම පිණිස හෝ තම සන්තකයෙහි ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම පිණිස කමිටුවේ යම් පරීක්ෂණයකට පැමිණෙන ලෙස කැඳවීම සහ සාක්ෂිකරුවකු ලෙස ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ ඔහු සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කිරීම ;

(ඇ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන නොතකා සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී අත්‍යාකාරව ආවේශ්‍ය නොකළ හැකි ලිඛිත හෝ වාචික හෝ යම් සාක්ෂියක් ආවේශ්‍ය කිරීම ;

(ඉ) එවැනි විභාගයකට හෝ විමර්ශනයකට හෝ එහි යම් කොටසකට මහජනයාට ඇතුළුවීමට ඉඩදීම හෝ එසේ ඉඩ නොදීම.

කමිටුව ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවන් සඳහා මුක්තිය.

10. (1) කමිටුව ඉදිරියේ සාක්ෂි දෙන තැනැත්තකුට ඒ සාක්ෂි සම්බන්ධයෙන්, අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවකු ඒ අධිකරණය ඉදිරියේ දෙන සාක්ෂි සම්බන්ධයෙන් නීතියෙහි ලා හිමිකම ලබන සියලු වරප්‍රසාදවලට හිමිකම තිබිය යුතු ය.

(2) කමිටුවට හෝ කමිටුව ඉදිරියේ හෝ දෙන ලද ලිඛිත වූ හෝ වාචික වූ හෝ යම් සාක්ෂියක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු, යම් අධිකරණයක දී යම් නඩුවකට, නඩු පැවරීමකට හෝ සිවිල් වූ හෝ අපරාධ වූ හෝ වෙනත් නඩු කටයුත්තකට යටත් නොවිය යුතු ය :

එසේ වුවද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට ඇතුළත් කිසිවකින්–

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ xi වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට බලපෑමක් සිදු නොවිය යුතු ය ; නැතහොත් ඒ කෙරෙහි බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුත්තේ ය ;

(ආ) කමිටුව ඉදිරියේ සාක්ෂි දෙන යම් සාක්ෂිකරුවකුට විරුද්ධව දණ්ඩ නීති සංග්‍රහයේ xi වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා, ඒ සාක්ෂිකරුගේ නම ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම නැතහොත් ඒ සාක්ෂිකරුගේ සාක්ෂිය හෝ එහි යම් කොටසක් හෙළිදරව් කිරීම තහනම් කරනු නොලැබිය යුතු ය ; නැතහොත් තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ තහනම් වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුත්තේ ය.

සිතාසි.

11. (1) කමිටුව විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක් ම කමිටුවේ සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු ය.

(2) යම් සිතාසියක් එහි නම්කළ තැනැත්තා වෙත ගෙන ගොස් භාරදීමෙන් භාරදෙනු ලැබිය යුතු අතර, එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, ඒ සිතාසිය ඒ තැනැත්තාගේ අවසන් වරට දැන සිටි පදිංචි ස්ථානයෙහි තැබීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් යැවීමෙන් භාර දෙනු ලැබිය යුත්තේ ය.

(3) සිතාසියක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ සිතාසියෙහි සඳහන් කර ඇති වේලාවේ දී හා ස්ථානයේ දී කමිටුව ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, කමිටුව විසින් ඔහුගෙන් අසනු ලබන ප්‍රශ්නවලට උත්තරදීම හෝ ඉදිරිපත් කරන ලෙස සිතාසියෙහි භාවය අනුව ඔහුට නියම කර ඇති සහ ඔහුගේ සන්තකයේ හෝ බලයෙහි ඇති ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම කළ යුතු ය.

කමිටුවට අපහාස කිරීම.

12. (1) කමිටුව සම්බන්ධයෙන්, කමිටුව ඉදිරිපිට දී හෝ අන්‍යාකාරයකින් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක්, ඒ කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද නම් හෝ නොකර හරින ලද නම්, ඉන් ඒ අධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ නම්, කරන ලද හෝ නොකර හරින ලද ඒ ක්‍රියාවෙන් කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් -

(අ) මේ පනත යටතේ භාර දෙන ලද සිතාසියක සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී කමිටුව ඉදිරියේ පෙනී සිටීම, කමිටුවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ආ) දිවුරුම හෝ ප්‍රතිඥා දීම, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ යථා පරිදි දිවුරා හෝ ප්‍රතිඥා දෙනු ලැබ, කමිටුව විසින් විභාග කෙරෙමින් හෝ විමර්ශනය කෙරෙමින් තිබෙන කරුණු සම්බන්ධව තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම කමිටුවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ඇ) කමිටුව විසින් තමා වෙත නිකුත් කරන ලද දැන්වීමක හෝ කරන ලද ලිඛිත ආඥාවක හෝ විධානයක නියමයන් අනුව ක්‍රියා කිරීම, කමිටුවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ඈ) මේ පනත යටතේ සිතාසියක් භාර දෙනු ලැබ, කමිටුවේ මතය අනුව, පරීක්ෂා කරනු ලබන හෝ විමර්ශනය කරනු ලබන කාරණාවල සත්‍යතාව නිගමනය කිරීම සඳහා අවශ්‍ය වූ ද තම සන්තකය හෝ බලය යටතේ ඇත්තා වූ ද, යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කමිටුවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ඒ තැනැත්තා කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

(3) කමිටුවේ අධිකාරියට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද සෑම අපහාස වරදක් සම්බන්ධයෙන්, ඒ වරද ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන ලද අපහාස වරදක් වූවාක් මෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඒ සෑම වරදක් ම විභාග කිරීමේ අධිකරණ බලය මෙයින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැවරෙන්නේ ය.

(4) යම් තැනැත්තකු විසින්, කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ යම් අපහාස වරදක් සිදුකර ඇති බවට කමිටුව විසින් නිශ්චය කරනු ලැබූ අවස්ථාවක, කමිටුව විසින් ඒ නිශ්චය කිරීම දැක්වෙන සහතිකයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවිය හැකි ය ; ඒ සෑම සහතිකයක් ම කමිටුවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එසේ වුවද නීතිපතිවරයා ඉවත් කිරීම පිළිබඳ පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සම්බන්ධයෙන් වන විට, ඒ අපහාස වරද අග්‍රවිනිශ්වයකාරවරයා විසින් සංඥේයත්වයට ගෙන, ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමේ වරදක් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයෙන් ඒ වරද සම්බන්ධව කටයුතු කළ යුතු ය.

(5) මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි, සංඥේයත්වයට ගැනීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය කල්පනා කරන අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුත්තක දී (4) වන උපවගන්තිය යටතේ අත්සන් කරන ලද සහ ඒ අධිකරණය වෙත යවන ලද සහතිකයක් යයි කියනු ලබන යම් ලේඛනයක් -

(අ) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, වැඩි දුර ඔප්පු කිරීමක් නොමැතිව එය එසේ වූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) සහතිකයේ දැක්වෙන නිශ්චය කිරීම කමිටුව විසින් කරන ලද බවට සහ නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි විය යුතු ය.

(6) කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි වූ වරදක් යයි කියනු ලබන යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුතුවල දී කමිටුවේ කිසිම සාමාජිකයකු, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සාක්ෂි කරුවකු වශයෙන් කැඳවීම හෝ ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය.

කමිටුවට සහායවීම සඳහා නිලධරයන් හා සේවකයන්.

**13.** මේ පනත යටතේ කමිටුව වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා කමිටුවට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි යම් නිලධරයන්ගේ හා සේවකයන්ගේ සහාය කමිටුව විසින් ලබාගත හැකි ය.

කමිටුවේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**14.** කමිටුවට සහාය වීම පිණිස පත් කරන ලද නිලධරයන් හා සේවකයන්, දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, කමිටුව විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක්ම හෝ විමර්ශනයක්ම ඒ නීති සංග්‍රහයේ අර්ථානුකූලව අධිකරණ නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

නඩු පැවරීමෙන් ආරක්ෂාව.

**15.** (1) කමිටුවේ සාමාජිකයකු හෝ කමිටුවට සහායවීම පිණිස පත් කරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඒ නිලධරයා, සේවකයා හෝ වෙනත් තැනැත්තා වශයෙන් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ

සේවකයාට විරුද්ධව අපහාස කිරීමේ වරද සම්බන්ධයෙන් හැර හෝ කමිටුවට වෙනත් යම් ආකාරයකින් සහාය වන වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුත්තේ ය.

(2) අපහාස වරදක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක කාර්ය සඳහා අවශ්‍ය පරිදි හැර කමිටුව විසින් මේ පනත යටතේ පවත්වනු ලබන යම් විභාගයක දී හෝ විමර්ශනයක දී කමිටුවට ලැබෙන යම් ලියවිල්ලක් යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලෙස හෝ දැන ගන්නට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයක් වෙත හෙළිදරව් කරන ලෙස කමිටුවේ සාමාජිකයකුට හෝ කමිටුවට සහාය වීම පිණිස පත් කරන ලද යම් නිලධරයකුට හෝ සේවකයකුට නියම කරනු නොලැබිය යුත්තේ ය.

(3) කමිටුව විසින් මේ පනත යටතේ එළඹෙන ලද තීරණයක් හෝ සපයන යම් වාර්තාවක් සම්බන්ධයෙන් කමිටුවේ යම් සාමාජිකයකුට විරුද්ධව යම් අධිකරණයක දී කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුත්තේ ය.

නිලධරයන් සහ සේවකයන් උපලේඛනගත නිලධරයන් වන බව.

**16.** කමිටුවට සහාය වීම සඳහා පත් කරන ලද නිලධරයන් සහ සේවකයන්, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක නිලධරයන් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

ඉවත් කිරීම සඳහා යෝජනා සම්මතය.

**17.** 8 වන වගන්තියේ (ආ) ඡේදය අනුව කමිටුවේ තීරණ ලැබුණු විට සහ වරදකරු බවට ඉන් තීරණය වී ඇත්නම්, කථානායකවරයා විසින් ඒ තීරණය, ඒ විභාගය පවත්වන ලද්දේ කවර ධුරයක් දරන තැනැත්තා සම්බන්ධයෙන් ද ඒ සඳහන් ධුරය දරන්නා ඉවත් කිරීම සඳහා, යෝජනාවක ආකාරයෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළ යුත්තේ ය.

ඉවත් කිරීම.

**18.** මේ පනතේ 17 වන වගන්තියට අනුකූලව න්‍යාය පුස්තකයෙහි එසේ ඇතුළත් කරනු ලැබූ යෝජනා සම්මතය, සම්බන්ධව පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය. පාර්ලිමේන්තුවේ (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයක් මන්ත්‍රීවරයන් ඒ යෝජනාවට පක්ෂව ඡන්දය දුනහොත්, ඒ යෝජනා සම්මතය අදාළවන ඒ ධුරය දරන්නා ජනාධිපතිවරයා විසින් අප්‍රමාදව ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

අර්ථ නිරූපණය.

**20.** මේ පනතෙහි, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස -

'නීතිපති' යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිපති ධුරය දරන්නා අදහස් වේ ; සහ

'පොලිස්පති' යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොලිස්පති ධුරය දරන්නා අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.